# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2369/04 – 2024 ජනවාරි මස 29 වැනි සඳුදා – 2024.01.29**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය, නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 541 - ගල්කිස්ස ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගල්කිස්ස ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/RTM/2019/149 සහ 2019.11.21 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – ගල්කිස්ස වත්ත වරි.අංක 37/2, ශ්‍රී ධර්මපාල මාවත – ප්‍රමාණය: හෙක්. 0.0532**

උතුරට: එම්. ඊ. එම්. ඒ. හුසේන් හිමිකම් කියන ගල්කිස්ස වත්ත ඉඩම සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ කැබලි අක්ෂර B; දකුණට: කැබලි අක්ෂර B සහ මුහුදුබඩ දුම්රිය මාර්ගය; බටහිරට: මුහුදුබඩ දුම්රිය මාර්ගය සහ එම්. ඊ. එම්. ඒ. හුසේන් හිමිකම් කියන ගල්කිස්ස වත්ත ඉඩම.

02. **කැබලි අක්ෂර ‘B’ – ගල්කිස්ස වත්ත වරි.අංක 37/3, ශ්‍රී ධර්මපාල මාවත – ප්‍රමාණය: හෙක්. 0.0531**

උතුරට: කැබලි අක්ෂර A සහ මාර්ගය; නැගෙනහිරට: මාර්ගය සහ සංඝමිත්තා පාර; දකුණට: සංඝමිත්තා පාර සහ මුහුදුබඩ දුම්රිය මාර්ගය; බටහිරට: මුහුදුබඩ දුම්රිය මාර්ගය සහ කැබලි අක්ෂර A.

හරින් ප්‍රනාන්දු,
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2018/WS/217.
2023 ඔක්තෝබර් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 – 0221



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*